සැකසුම :- එම්.එම්.බී.නිශානි මිය මිය /ර/ඇඹි/හල්මිල්ලකැටිය ම.වි. 3 ශ්‍රේණිය බාර

- **දුවේ පුතේ"**

පහත සඳහන් දෙබස කිහිප වරක් කියවන්න.

**දෙබස**

සහන් - යාළුවේ, යාළුවේ
පඹයා - ඇයි සහන් ?
සහන් - මට ඔයා ගැන දුක යි
පඹයා - ඒ ඇයි සහන් ?
සහන් - ඔයා හැම දා ම මහ අවුවේ වේලෙනවා. වැසස් ට තෙමෙනවා.
පඹයා - මං ඔයාගේ තාත්තගේ ගොයම් බලා ගන්නව නේ.
සහන් - හෙට ගොයම් කපනව නේ.
පඹයා - එහෙනම් මට හෙට ගෙදර යන්න පුළුවනි.
සහන් - ඔයා යමු අපේ ගෙදර
පඹයා - තාත්තාගෙන් අහන්නකෝ . . .
සහන් - තාත්තා එපා කියන්නේ නැහැ. ඔයා මගෙ යාළුව නේ . . .
පඹයා - එහෙනම් අපිට හෙට ඉඳලා සෙල්ලම් කරන්න පුළුවනි. ඔයා හරි හොඳ යහළුවෙක්.

"පුතේ දුවේ" දෙබසක් ලිවීමේ දී පහත විධි අනුගමනය කරන්න.

* කතා කරන බසින් ලිවීම
* ප්‍රශ්නෝත්තර ක්‍රමයට ලිවීම
* නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම
* දෙබසෙහි නිශ්චිත අවසානයක් තිබීම

පහත මාතෘකා අනුව ඔබත් දෙබස් ලියන්න.

- ළමයා හා ලේනා
- හාවා හා කොකා
- කුඹියා හා වෙයා
- ගොළුබෙල්ලා හා ළමයා